ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone
ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම් ... Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gam ... ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone
ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම් ... Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gam ... ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone
ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha

# ගම්පහ අධ්‍යාපන කලාපය
# Gampaha Education Zone

## දෙවන වාර ඇගයීම - 2025
## Second Term Evaluation - 2025

| ශ්‍රේණිය Grade | 13 | විෂයය Subject | ව්‍යාපාර අධ්‍යයනය - I | කාලය Time | පැය 02 |
|---|---|---|---|---|---|

නම : ........................................................................................................................................................

★ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

★ 01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට 1 , 2 , 3 , 4 , 5 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

01. මැණික් ගැරීමේ හා මැණික් ගල් ඔප මට්ටම් කර ආභරණ නිපදවීමේ ව්‍යාපාරයක් චාරුනී විසින් පවත්වාගෙන යයි. මෙහි අන්තර්ගත ව්‍යාපාර සම්බන්ධය වන්නේ,

1. කාර්මික නිෂ්පාදන හා සේවා ලෙස ය.
2. ප්‍රාථමික නිෂ්පාදනය හා ද්විතියික නිෂ්පාදනය ලෙස ය.
3. කෘෂිකාර්මික නිෂ්පාදනය හා කාර්මික නිෂ්පාදනය ලෙස ය.
4. ප්‍රාථමික නිෂ්පාදනය හා තෘතියික නිෂ්පාදය ලෙස ය.
5. ද්විතියික නිෂ්පාදනය හා තෘතියික නිෂ්පාදනය ලෙස ය. (...........)

02. ව්‍යාපාර විකාශනයේ විවිධ අවස්ථා හා එම අවස්ථා හා බැඳුණු සුවිශේෂ සිදුවීම් පහත වගුවේ දක්වා ඇත.

| අවස්ථා | සිදුවීම් |
|---|---|
| 1. ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය | A උපකාරක සේවාවල ආරම්භය |
| 2. භාණ්ඩ හුවමාරුව | B මහා පරිමාණ නිෂ්පාදනය |
| 3. මුදල් භාවිතය | C සෘජු නිෂ්පාදනය |
| 4. කාර්මික විප්ලවය | D වෙළඳමේ ආරම්භය |

ඉහත තීරු දෙක නිවැරදිව ගැලපූ විට,

1. 1A , 2C , 3B , 4D
2. 1B , 2D , 3C , 4A
3. 1C , 2A , 3B , 4D
4. 1D , 2A , 3C , 4B
5. 1C , 2D , 3A , 4B

(...........)

03. පහත සඳහන් වන්නේ බාහිර පරිසර (සාර්ව) සංසිද්ධි කිහිපයකි.

A ඛනිජ තෙල් සම්පත් ක්‍රමයෙන් හිඟ වී යාම
B වෙළඳ කලාප වල ව්‍යාප්තිය
C වරලත් සමාගම් ක්‍රමය ව්‍යාප්ත වීම
D දේශගුණික විපර්යාස බහුල වීම
E බ්‍රිතාන්‍ය යුරෝපා සංගමයෙන් ඉවත්ව යාම
F පරිසර දූෂණය ඉහළ යාම

ඉහත සිද්ධි ස්වභාවික පරිසර සාධක හා ගෝලීය පරිසර සාධක ලෙස වෙන්කර දැක්වූ විට,

1. BCE / ADF
2. DF / ABCE
3. ADF / BCE
4. BCDE / AF
5. ADEF / BC

(...........)

04. ''නැණවත් පාරිභෝගිකයෙකු වූ සුධීරා මහත්මිය භාණ්ඩ මිලදී ගැනීමේදී නිතරම භාණ්ඩවල ගුණත්වය පිළිබඳ ව අවධානය යොමු තරමින් ඒවායේ මිල ගණන් වෙළෙඳුන්ගෙන් විමසමින් මිල ගණන් සසඳා බැලීමට විශාල කාලයක් වැය කරනු ලබයි.'' ඉහත සිද්ධිය තුළින් පිළිඹිබු වන්නේ මින් කුමක්ද?

1. පාරිභෝගික අධ්‍යාපනයට ඇති අයිතිය
2. සමාජය ගැන සැලකිලිමත් වීම
3. සවන් යොමු කරවා ගැනීමට ඇති අයිතිය
4. තෝරා ගැනීමට ඇති අයිතිය
5. විචාරාත්මක දැනුවත්භාවය

(...........)

05. පහත දැක්වෙන්නේ විවිධ සමාගම් වර්ග හා ඒවාට අදාළ ලක්ෂණ කීපයකි.

| ව්‍යාපාර සංවිධාන වර්ග | ලක්ෂණ |
|---|---|
| A විදේශීය සමාගම් | 1. කොටස් වෙළඳපලේ ලේඛනගත කරයි |
| B රාජ්‍ය සමාගම් | 2. කොටස් ප්‍රසිද්ධියේ නිකුත් නොකරයි |
| C නිල ලැයිස්තුගත සමාගම් | 3. ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරයි |
| D ඇපයෙන් සීමිත සමාගම් | 4. ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කටයුතු තහනම් වේ |
| E අක්වෙරළ සමාගම් | 5. රජයේ පාලනය යටතේ පවතී |

ඉහත සමාගම් හා ඒවායේ ලක්ෂණ නිවැරදිව ගැලපූ විට,

1. A - 4 , B - 2 , C - 5 , D - 1 , E - 3
2. A - 3 , B - 5 , C - 1 , D - 2 , E - 4
3. A - 4 , B - 5 , C - 1 , D - 2 , E - 3
4. A - 4 , B - 2 , C - 1 , D - 2 , E - 3
5. A - 3 , B - 1 , C - 5 , D - 2 , E - 4

(...........)

06. වරලත් හිමියාට හා වරලත් ලාභියාට ව්‍යාපාර ක්‍රමයෙන් ලැබෙන ප්‍රතිලාභ කිහිපයක් පහත දැක්වේ.

A විශාල ව්‍යාපාරයකට පිවිසීමට හැකි වීම
B අසාර්ථකවීමේ ප්‍රවණතාව අඩු වීම
C වරලත් ගිවිසුමට අනුව වරලත් ලාභියා වගකීම් සපුරාලීම
D පුරස්කාරයක් හිමි වීම
E මූල්‍ය පහසුකම් ලබාගත හැකි වීම
F ව්‍යාපාරය පුළුල් වීම

ඉහත ප්‍රතිලාභ අතරින් වරලත් හිමියාට හා වරලත්ලාභියාට ලැබෙන ප්‍රතිලාභ වෙන වෙනම දක්වා ඇති පිළිතුර වන්නේ,

| | වරලත්හිමියා | වරලත්ලාභියා |
|---|---|---|
| 1. | A , B , C | D , E , F |
| 2. | B , C , D | A , E , F |
| 3. | C , D , E | A , B , F |
| 4. | B , E , F | A , C , D |
| 5. | C , D , F | A , B , E |

(...........)

07. ව්‍යවසායකත්වය තුළින් අත්වන ආයතනික, සමාජ හා ආර්ථික ප්‍රතිලාභ කීපයක් පහත දැක්වේ.

A නව රැකියා අවස්ථා උත්පාදනය වීම
B ව්‍යාපාර කටයුතු පුළුල් වීම
C ජනතාවගේ ජීවන මට්ටම ඉහළ යාම
D අඛණ්ඩව වර්ධනය වීම
E නව වෙළඳපලවල් සංවර්ධනය වීම
F නව භාණ්ඩ හා සේවා පරිභෝජනය

ඉහත සඳහන් දෑ අතුරින් සමාජ හා ආර්ථික ප්‍රතිලාභ පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

1. A , B , C , D  2. A , C , D , E  3. A , B , D , E  4. C , D , E , F  5. A , C , E , F

(...........)

08. කෝසල රු. 200 000ක් මිල සඳහන් වූ 'ලැප්ටොප්' පරිගණකයක් X සමාගමෙන් මිලදී ගැනීම සඳහා රු. 100 000 ක් මුදලින් ගෙවා ඉතිරි රු. 100 000ක මුදල පසුව ගෙවීමට ආයතනය සමඟ ගිවිසගත්තා ලදි. ඉහත සිද්ධියේ දැක්වෙන මුදලේ කාර්යයන් ඇතුළත් පිළිතුර තෝරන්න.

A වටිනාකමේ සන්නිධියක්
B විනිමය මාධ්‍යයක්
C විලම්භිත ගෙවුම් මාධ්‍යයක්
D වටිනාකම මැනීමේ මිනුමක්

1. B C D  2. A B C  3. A හා C  4. B හා D  5. A හා D

(...........)

09. ප්‍රධාන බැංකු ණය වර්ග දෙක වන්නේ,

1. ව්‍යාපාරික හා පාරිභෝගික ණය සේවා
2. දිගුකාලීන හා කෙටිකාලීන ණය සේවා
3. ස්ථාවර හා තාවකාලික අයිරා පහසුකම්
4. ආයතනික හා පුද්ගල ණය සේවා
5. භාණ්ඩ ණය හා වෙළඳ ණය සේවා

(...........)

10. ණයවර ලිපි නිකුත් කිරීමේදී තැන්පත් කළ යුතු අවම මුදල් ප්‍රමාණය නියම කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාවිතා කරන,

1. ප්‍රමාණාත්මක ණය සීමා පැනවීමකි
2. විවෘත වෙළඳපොළ කටයුත්තකි
3. ගුණාත්මක ණය සීමා පැනවීමකි
4. මුදල් සැපයුම පාලනය කිරීමකි
5. ආනයන සීමා කිරීමකි

(...........)

11. පහත වගුවේ රක්ෂණ වර්ග කිහිපයක් හා රක්ෂණාවරණ කිහිපයක් දක්වා ඇත.

| රක්ෂණාවරණ | රක්ෂණ වර්ගය |
|---|---|
| 1. තෙවන පාර්ශව ගිනි හා සොරකිය රක්ෂණය | A ජීවිත රක්ෂණය |
| 2. යාවජීව රක්ෂණය | B සමුද්‍රිය රක්ෂණය |
| 3. ආනුශංගික අලාභ රක්ෂණය | C මෝටර්රථ රක්ෂණය |
| 4. අනාගත ආවරණ ඔප්පුව | D ගිනි රක්ෂණය |

ඉහත රක්ෂණාවරන අනුපිළිවෙළ අනුව ඒවා අයත්වන රක්ෂණ වර්ගය නිවැරදිව ගලපා ඇති වරණය තෝරන්න.

1. CDBA  2. CADB  3. DACB  4. CDAB  5. DBAC

(...........)

12. පහත දැක්වෙන්නේ විවිධ සන්නිවේදන මාධ්‍යවල වාසි හා අවාසි කිහිපයකි.

A වඩාත් විස්තරාත්මකව තොරතුරු ඉදිරිපත් කළ හැකි වීම
B පුළුල් ව්‍යාප්තිය
C තොරතුරු සන්නිවේදනය කළ බවට සාක්ෂියක් නොමැති වීම
D තොරතුරු ඉතා ඉක්මණින් හා රහසිගතව ඉදිරිපත් කළ හැකි වීම
E ප්‍රතිචාරය ක්ෂණිකව සිදු නොවීම

ඉහත දෑ අතරින් ලිඛිත සන්නිවේදනයට වඩාත් ම ගැලපෙන වාසි/ අවාසි ඇතුළත් වරණය කුමක්ද?

1. A හා D  2. A හා E  3. B හා C  4. A හා B  5. D හා E

(...........)

13. පහත දැක්වෙන්නේ ප්‍රවාහන හා සැපයුම් සේවා පද්ධති වර්ග කීපයක් හා ඒ ඒ පද්ධතීන්ට උචිත නිෂ්පාදන කීපයකි.

| | A | B |
|---|---|---|
| a. | සමබර වූ ප්‍රවාහන හා සැපයුම් පද්ධති | 1. ගෑස්, බීම බෝතල් |
| b. | නිෂ්පාදන ක්‍රියාවලිය දක්වා වූ ප්‍රවාහය සංකීර්ණ වූ පද්ධති | 2. අවි ආයුධ |
| c. | නිෂ්පාදනයෙන් පසු අවසන පාරිභෝගිකයා අතට පත් කිරීම සංකීර්ණ වූ පද්ධති | 3. පාරිභෝගික භාණ්ඩ |
| d. | නිෂ්පාදන අලෙවියෙන් පසු ආපසු ප්‍රවාහය සහිත පද්ධති | 4. ගුවන් යානා |

1. a - 4 , b - 2 , c - 3 , d - 1
2. a - 2 , b - 3 , c - 4 , d - 1
3. a - 2 , b - 4 , c - 3 , d - 1
4. a - 3 , b - 4 , c - 2 , d - 1
5. a - 3 , b - 2 , c - 4 , d - 1

(...........)

14. මූල්‍ය හා තාක්ෂණික ආධාර ලබාදීමේත් විනිමය අනුපාත හා ගෙවුම්ශේෂ නිරීක්ෂණය කිරීමේත් ජාත්‍යාන්තර සංවිධානය ලෙස හඳුන්වන්නේ මින් කුමක්ද?
1. ලෝක වෙළඳ සංවිධානය
2. ආසියානු සංවර්ධන බැංකුව
3. ජාත්‍යාන්තර මූල්‍ය අරමුදල පිළිබඳ ජාත්‍යාන්තර බැංකුව
4. ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුව
5. යුරෝපා සංගමය (...........)

15. මැදපෙරදිග රටවල් ඛනිජ තෙල් අපනයනය හරහා විදේශ වෙළඳාමට සම්බන්ධ වී ඇත. මින් හඳුනාගත හැකි විදේශ වෙළඳාමට සම්බන්ධ වී ඇත. මින් හඳුනාගත හැකි විදේශ වෙළඳාම සඳහා පදනම් වී ඇති සාධකය කුමක්ද?
1. සාපේක්ෂ පිරිවැය න්‍යාය
2. භාණ්ඩ ප්‍රවර්ධනය
3. වෙළඳ බාධක අවම වීම
4. ස්වාභාවික සම්පත් බෙදීයාමේ විෂමතාවය
5. සමහර නිෂ්පාදිත සම්බන්ධව සමහර රටවලට නීතිමය ඒකාධිකාරියක් පැවතීම (...........)

16. කළමණාකරණයට හා කළමණාකරණ ක්‍රියාවලියේ කාර්යයන්ට (Function) අදාළ වඩාත් නිවැරදදි ප්‍රකාශය තෝරන්න.
1. කිසියම් ගැටළුවකට ගනු ලැබූ නිශ්චිත විසඳුමක් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය 'කළමණාකරණය' වේ.
2. ආයතනයක පරමාර්ථ හා අරමුණු ඉටුකරගැනීමට ගනු ලබන පියවර ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය 'සැලසුම්කරණය' වේ.
3. ආයතනයක පරමාර්ථ හා අරමුණු ඉටුකරගැනීමට සම්පත් බෙදාහැරීමේ ක්‍රියාවලිය 'සංවිධානකරණය' වේ.
4. ආයතනයක පරමාර්ථ හා අරමුණු ඉටුකරගැනීම සඳහා සේවකයන්ට බලපෑම් කිරීමේ ක්‍රියාවලිය 'මෙහෙයවීම' වේ.
5. ආයතනයක පරමාර්ථ හා අරමුණු ඉටුකරගන්නා ආකාරයට සැලසුම්ගත හා සත්‍ය ප්‍රතිඵල අතර වෙනස්කම් නිවැරදි කිරීමට පියවර ගැනීමේ ක්‍රියාවලිය 'පාලනය' වේ. (...........)

17. නිෂ්පාදන ආයතනයක නිවැරදි දේ නිවැරදි අයුරින් සිදු කිරීමේ සෘජු ප්‍රතිඵලය වන්නේ,
1. එම ව්‍යාපාරයේ කීර්තිනාමය ඉහළ යාමයි.
2. එම ව්‍යාපාරයේ සම්පත් භාවිතය ඉහළ යාමයි.
3. එම ව්‍යාපාරයේ සඵලදායකත්වය පහළ යාමයි.
4. එම ව්‍යාපාරයේ ඵලදායකත්වය ඉහළ යාමයි.
5. එම ව්‍යාපාරයේ නිෂ්පාදන පිරිවැය ඉහළ යාමයි. (...........)

18. පාලන අවකාශය යනුවෙන් අදහස් වන්නේ,

1. සේවකයෙකුට පවරා ඇති කාර්ය කොටස යි.
2. කළමණාකරුවෙකු කෙරෙහි සේවකයෙකු තුළ ඇති වගවීම යි.
3. කළමණාකරුවෙකුට සෘජුවම වාර්තා කරනු ලබන සහායක සංඛ්‍යාව යි.
4. එක් සේවකයෙකු එක් කළමණාකරුවෙකුට වගකීම යි.
5. කළමණාකරුවෙකු සතු අණදීමේ හැකියාව යි. (...........)

19. සංවිධානය නියෝජනය කරමින් බාහිර පාර්ශවයන්ට තොරතුරු සැපයීමේ කාර්යය අයත්වන කළමණාකරණ උපභූමිකාව වන්නේ,

1. මාධ්‍ය ප්‍රකාශක
2. තොරතුරු බෙදාහරින්නා
3. සබඳතා පවත්වන්නා
4. සාකච්ඡා කරන්නා
5. නායකයා

(...........)

20. කළමණාකරුවෙකුට බලය ලැබෙන මූලාශ්‍ර කිහිපයක් පහත දක්වා ඇත.

A නීතිමය බලය
B දඬුවම් දීමේ බලය
C ත්‍යාග දීමේ බලය
D බලපෑම් කිරීමේ බලය
E විශේෂඥ බලය

ඉහත දැ අතුරෙන් තනතුරට අදාළ බලය පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

1. B C D  2. A B C  3. A හා C  4. B හා D  5. A හා D (...........)

21. කාර්යය ඉටුකිරීමේදී අනුගාමිකයන්ට ඉහළ නිදහසක් දී ඇති නායකත්ව ශෛලිය කුමක්ද?

1. ප්‍රජාතන්ත්‍රවාදී
2. ඒකාධිපති
3. කාර්ය අභිමුඛ
4. නිර්බාධවාදී
5. අවස්ථානුකූල

(...........)

22. ආයතනයක අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා සීමිත සම්පත් උපයෝගී කරගෙන ඉහළ ගුණත්වයෙන් යුත් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා අදාළ කළමණාකරණ කටයුතු සමූහය හැඳින්වනුයේ,

1. මෙහෙයුම් කළමණාකරණය
2. අලෙවි කළමණාකරණය
3. මූල්‍ය කළමණාකරණය
4. පර්යේෂණ හා සංවර්ධනය
5. මානව සම්පත් කළමණාකරණය

(...........)

23. පරිවර්තන ක්‍රියාවලියේ විවිධ අවස්ථාවලදී යෙදවුම්වලට වටිනාකමක් එකතු වවීමෙන් නිෂ්පාදිතයේ අගය වැඩිවීම හඳුන්වනුයේ,

1. විකුණුම් මිල  2. එකතු කළ අගය  3. ලාභය  4. අතිරික්තය  5. වැඩි වූ අගය

(...........)

24. කිසියම් නිෂ්පාදන ආයතනයක නිශ්චිත අනාගත කාලපරිච්ඡේදයක් තුළ කුමන භාණ්ඩ හා සේවා කෙසේ නිෂ්පාදනය කළ යුතුද,කොපමණ නිෂ්පාදනය කළ යුතුද, කවර දිනක නිෂ්පාදනය කළ යුතුද යන්න පිළිබඳව පුළුල් ව කරනු ලබන කටයුතු හැඳින්වනුයේ,

1. නිෂ්පාදන පාලනය
2. නිෂ්පාදන ඉංජිනේරුකරණය
3. නිෂ්පාදන සැලසුම්කරණය
4. පර්යේෂණය හා සංවර්ධනය
5. ද්‍රව්‍ය මිලදී ගැනීම

(...........)

25. පහත වගුවේ කම්හල් පිරියත සැලසුම් වර්ග හා ඒවා වඩාත් යෝග්‍ය ව්‍යාපාර ආයතන වර්ග කිහිපයක් දක්වා ඇත.

| පිරියත සැලසුම් වර්ග | රක්ෂණ වර්ගය |
|---|---|
| 1. නිෂ්පාදිත පිරිවැය<br>2. කුටි පිරියත<br>3. ස්ථාවර ස්ථානීය පිරියත<br>4. ක්‍රියාවලි පිරියත | A ඇඟලුම් කර්මාන්ත ශාලා<br>B ගෘහ භාණ්ඩ නිෂ්පාදන ආයතන<br>C මෝටර් රථ නිෂ්පාදන ආයතන<br>D ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු |

ඉහත දී ඇති පිරියත සැලසුම් ක්‍රම අනුපිළිවෙල අනුව ඒවාට වඩාත් යෝග්‍ය ව්‍යාපාර ආයතන නිවැරදිව ගලපා ඇති වරණය කුමක්ද?

1. B , A , D , C 2. C , B , D , A 3. C , A , D , B 4. B , D , A , C 5. B , D , C , A

(...........)

26. භාණ්ඩයක ගුණත්වය අංගෝපාංග කිහිපයකින් සමන්විත ය. එවැනි අංගෝපාංග පමණක් ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.

1. මනා ක්‍රියාකාරීත්වය / උචිත බව / කල්පැවැත්ම / ආරක්ෂිත බව / ශූන්‍ය දෝෂ / ප්‍රමිතියට අනුකූල වීම
2. උචිත බව / ප්‍රමිතියට අනුකූල වීම / ආරක්ෂිත බව / කල්පැවැත්ම / නෛතික බව / ශූන්‍ය දෝෂ
3. ප්‍රමිතියට අනුකූල වීම / ආරක්ෂිත බව / නෛතික බව / කල්පැවැත්ම / උසස් තත්ත්වය / මනා ක්‍රියාකාරීත්වය
4. නෛතික බව / මනා ක්‍රියාකාරීත්වය / කල් පැවැත්ම / ශූන්‍ය දෝෂ / උචිත බව / විශ්වාසවන්තභාවය
5. මනා ක්‍රියාකාරීත්වය / කල්පැවැත්ම / ප්‍රමිතියට අනුකූල වීම / උචිත බව / ආරක්ෂිත බව / විශ්වාසවන්තභාවය

(...........)

27. සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පයට අයත් අංශ හා ඒවාට අදාළ විස්තර පහත වගුවෙන් ඉදිරිපත් කරයි.

| අංශ | විස්තරය |
|---|---|
| 1. සමෝධානික අලෙවිකරණය | A ව්‍යාපාරික ඉලක්ක, පාරිභෝගික තෘප්තිය මෙන්ම සමාජය කෙරෙහි ත් එකසේ අවධානය යොමු කළ යුතු බව අවධාරනය කිරීම |
| 2. කාර්ය සාධන අලෙවිකරණය | B ආයතනයේ සියලුම සේවකයින් ගනුදෙනුකරුට හොඳ සේවාවක් ලබා දීමට සහයෝගයෙන් හා සක්‍රියව එකතු වීම |
| 3. අභ්‍යන්තර අලෙවිකරණය | C ව්‍යාපාරයේ සියලුම ඇල්මැති පාර්ශවයන් දීර්ඝකාලීනව දෙපාර්ශවයටම ප්‍රතිඵලදායී සම්බන්ධතා ගොඩ නැගීම |
| 4. සම්බන්ධතා අලෙවිකරණය | D අලෙවිකරණ මිශ්‍රයේ සියලු ම විචල්‍යයන් ඉලක්ක ගනුදෙනුකරුවන් තෘප්තිමත් කිරීම අරමුණු කරගෙන ක්‍රියාත්මක විය යුතු බව |

ඉහත දී ඇති අංශ අනුපිළිවෙළ අනුව අදාළ විස්තර නිවැරදිව ගලපා ඇති වරණය කුමක්ද?

1. DABC 2. ABDC 3. DBAC 4. CABD 5. CDBA

(...........)

28. පහත දෑ අතුරෙන් සේවා අලෙවි මිශ්‍රයට විශේෂිත වූ විචල්‍ය පමණක් ඇතුලත් නිවැරදි පිළිතුර කුමක්ද?

1. වේටර් , ප්‍රචාරණය , දීමනා
2. ඍජු අලෙවිකරුවන් , වට්ටම් , සන්නම්
3. වෛද්‍යවරයා , ස්වයංක්‍රීය සේවා ක්‍රියාවලිය , වයිෆයි
4. සුපරීක්ෂක , තොග , ගුණත්වය
5. ප්‍රවාහනය , ඇසුරුම් , වයිෆයි

(...........)

29. ඇසුරුමක් සැලසුම් කිරීමේදී ආරක්ෂාවක් ලැබීම, හඳුනා ගැනීමේ පහසුව, ආකර්ෂණීය පෙනුමක් ලැබීම, තොරතුරු සැපයීම වැනි දෑ පිළිබඳ සලකා බලනුයේ කුමන කරුණක් යටතේ ද?

1. නිෂ්පාදිතයේ ස්වභාවය
2. තාක්ෂණික යෝග්‍යතාවය
3. වෙළෙන්දාට ඇති පහසුව
4. පාරිභෝගිකයාට ඇති පහසුව
5. නිෂ්පාදිතයාට ලැබෙන ප්‍රයෝජන

(...........)

30. මූල්‍ය කළමණාකරණයේ මූලික අරමුණ වනුයේ,

1. ලාභය උපරිම කිරීම
2. කොටසක ඉපයුම් උපරිම කිරීම
3. විකුණුම් උපරිම කිරීම
4. හිමිකරුවන්ගේ ව්‍යාපාරය හා සබැඳි අගය උපරිම කිරීම
5. වෙළඳපලේ රැඳී සිටීම (..........)

31. අ) මිනිස් අවශ්‍යතා සපුරා ගන්නා විවිධ ආකාර .......................................... ලෙස හඳුන්වන අතර ඒවා මිනිසාගේ ................................................. කිරීමට උපකාරී වේ.

ආ) ස්වභාවික පරිසර නොනසා එළදායී වෙනස්කම් කිරීම කරනුයේ කෙසේ ද යන්න පිළිබඳ ව සැලකිලිමත් වී ................................................. වෙනුවෙන් ගෝලීය පරිසරය ආරක්ෂා කිරීම සඳහා වන මානව ක්‍රියාකාරකම් ................................................. තුළින් අපේක්ෂා කෙරේ.

32. අ) අභ්‍යන්තර මිල ස්ථායීතාව තුළින් ..................................... ද බාහිර මිල ස්ථායීතාවය තුළින් ................................ ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම ද සිදු කෙරේ.

ආ) 150 22000 ප්‍රමිතිය තුළින් ........................................... ආරක්ෂාව සහතික කෙරෙන අතර හොඳ නිෂ්පාදන පුරුදු ඇති ආයතන වලට ................................................ පිරිනමනු ලබයි.

33. අ) රක්‍ෂණ සමාගමක් විසින් භාරගන්නා ලද රක්‍ෂණ අවධානමක් එම ආයතනය විසින් තවත් රක්‍ෂණ සමාගමක හෝ රක්‍ෂණ සමාගම් කිහිපයක රක්‍ෂණය කිරීම ................................................ ලෙස හඳුන්වන අතර විශාල වටිනාකමක් ඇති වත්කමක් සම්බනධයෙන් ඇති අවධානමක් කොයස් වශයෙන් වෙන්කර රක්‍ෂණ සමාගම් කිහිපයකට භාරදීම ................................................ වේ.

ආ) සමුද්‍රීය රක්ෂණයේ මූලික කොටස් දෙක ................................................ රක්‍ෂණය හා ........................................ රක්ෂණය වේ.

34. අ) පණිවිඩය ලබන්නා විසින් ඇසුන හෝ කියවූ පණිවිඩය පිළිබඳ ව ක්‍රියා කරන ආකාරය .................................. ලෙස හඳුන්වන අතර එය සන්නිවේදන ක්‍රියාවලියේ ...............................................

ආ) අන්තර්ජාලය පදනම් කර ගනිමින් ......................................... ඇති දත්ත වලට .................................. පමණක් ළඟා වීමට පහසුකම් සලසා ඇති ආයතනමය ජාලය අභ්‍යන්තර ජාල (ඉන්ට්‍රානෙට්) ලෙස හඳුන්වයි.

35. අ) රටක් කිසිදු බාධාවකින් තොරව භාණ්ඩ ආනයනය හා අපනයනය කිරීමට අවකාශයක් පැවතීම .................................. නම් වේ.

ආ) විදේශ වෙළඳ කටයුතු වලදී ආනයන සටහන්කරය ......................................... විසින් තම රටේ ............................ වෙත ඉදිරිපත් කරයි.

36. අ) සංවිධානයක ...................................... ඉටුකරගැනීම පිණිස පුද්ගලයින්ගේ හෝ කණ්ඩායමක චර්යාව කෙරෙහි බලපෑම් කිරීමේ හැකියාව ..................................... වේ.

ආ) කිසියම් කාර්යයක් ඉටු කිරීමේදී කළයුතු හා නොකළ යුතු දේ පිළිබඳව නිශ්චිතව විස්තර කිරීමට සකස් කරන ලද දර්ශකය ...................................... වන අතර නිශ්චිත කාර්යයක් ඉටු කිරීමට සකස් කරන ලද දර්ශකය ..................................... වන අතර නිශ්චිත කාර්යයක් ඉටු කිරීමට අවශ්‍ය වන සම්පත් හා එය යොදා ගන්නා ආකාරය පිළිබඳ ප්‍රධාන හා උප කොටස්වලට බෙදා විස්තර කරන්නේ ...................................... මගිනි.

37. අ) ආයතනයක් දිගු කාලයේ දී ළඟාකරගැනීමට අපේක්ෂිත ප්‍රතිඵල ................................................... ලෙස හැඳින්වෙන අතර ආයතනයක් කෙටි කාලයේ දී අත්පත් කරගැනීමට අපේක්ෂා කරන දෑ ........................................ වේ.

ආ) මානව කුසලතා ........................................... කළමණාකරුවන් විසින් ප්‍රගුණ කළ යුතු කුසලතාවයකි. ........................................ කුසලතා පළමු පෙළ කළමණාකරුවන්ට වැඩිපුර අවශ්‍ය වේ.

38. අ) සත්‍ය ප්‍රතිඵල .......................................... සමඟ සැසඳේනම් ඉන් පැහැදිලි වන්නේ ............................................ සතුටුදායක බවය.

ආ) අක්‍රිය වූ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම ........................................ පාලනයටත්, නිවැරදි යන්ත්‍ර නඩත්තු කිරීම .................................................. පාලනයටත් නිදසුන් ලෙස දැක්විය හැකිය.

39. අ) ගෝලීය ව්‍යාපාර පරිසරය තුළ ................................................ සාර්ථකව මුහුණ දීමට හැකිවීම සහ නිෂ්පාදන පිරිවැය අවම කරගත හැකි වීම නිසා ............................................ වැඩිකරගත හැකි වීම මෙහෙයුම් කළමණාකරණයේ වැදගත්කමකි.

ආ) නිෂ්පාදන ක්‍රියාවලිය ................................................. කිරීම සඳහා අවශ්‍ය ................................................. පහසුකම් සැලසුම් කිරීම කම්හල් පිරියත සැලසුම් කිරීම ලෙස හැඳින්වේ.

40. අ) ස්ථාවර පිරිවැය සහ ................................................ පිරිවැය යන දෙකෙහි එකතුව ............................. පිරිවැය ලෙස හැඳින්වේ.

ආ) නිෂ්පාදන ක්‍රියාවලිය ............................................ කිරීම සඳහා අවශ්‍ය ......................................... පහසුකම් සැලසුම් කිරීම කම්හල් පිරියත සැලසුම් කිරීම ලෙස හැඳින්වේ.

41. පහත සඳහන් තර්ජන ව්‍යාපාරයකට එල්ල වන්නේ කුමන අභ්‍යන්තර පරිසර බලවේගයන්ගෙන් දැයි ලියන්න.

| තර්ජන | අභ්‍යන්තර පරිසර බලවේග |
|---|---|
| 1. ණයට ලබාදීම නතර කිරීම | ........................................................ |
| 2. ක්‍රය ශක්තිය පහළ යාම | ........................................................ |
| 3. සාර්ථක ප්‍රවර්ධන ක්‍රම අනුගමනය කිරීම | ........................................................ |
| 4. ඉදිරි වසරේදී චීන සමාගමක් මෙරට තුළ ව්‍යාපාර කටයුතු ඇරඹීමට සූදානම් වීම | ........................................................ |
| | ........................................................ |

42. ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව භාවිතා කරන උපකරණ හතරක් නම් කරන්න.

1. ........................................................................
2. ........................................................................
3. ........................................................................
4. ........................................................................

43. ව්‍යවසායකත්ව කුසලතා හතරක් නම් කරන්න.

..............................................................................................................................................................
..............................................................................................................................................................
..............................................................................................................................................................
..............................................................................................................................................................

44. ණයපත් සම්බන්ධ පාර්ශව නම් කරන්න.

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

45. විදේශ වෙළෙඳාමේදී මුදල් ගෙවීම සඳහා යොදාගන්නා ක්‍රම 04ක් දක්වන්න.

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

46. රටක ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා හේතු වන සාධක හතරක් නම් කරන්න.

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

47. භාණ්ඩයක තත්ව පාලනය සඳහා ආයතනයක් විසින් යොදාගනු ලබන ක්‍රම මොනවාද?

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

48. එක්තරා නිෂ්පාදන ආයතනයක මසක් ඇතුළත ඇස්තමේන්තු නිෂ්පාදන ඒකක සංඛ්‍යාව සත්‍ය නිෂ්පාදන ඒකක සංඛ්‍යාව හා සමාන විය. එසේ වීමට හේතු මොනවාද?

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

49. ව්‍යාපාරයක් විසින් ද්‍රව්‍ය මිලදී ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද?

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

50. ව්‍යාපාරයක දිගුකාලීන මූල්‍ය අවශ්‍යතා හෙවත් ස්ථාවර ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා නිදසුන් දක්වන්න.

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone
ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha

## ගම්පහ අධ්‍යාපන කලාපය
## Gampaha Education Zone

### දෙවන වාර ඇගයීම - 2025
### Second Term Evaluation - 2025

| ශ්‍රේණිය Grade | 13 | විෂයය Subject | ව්‍යාපාර අධ්‍යයනය - II | කාලය Time | පැය 03 |
|---|---|---|---|---|---|

නම : ..........................................................................................................................................

සැලකිය යුතුයි :-

★ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න 2 බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 6කට පිළිතුරු සපයන්න.

## I කොටස

01. ඉසුරු කොටගල ප්‍රදේශයේ කුඩා තේ වතු හිමියෙක් වන අතර ඔහුගේ බිරිඳට සේවකයන් 200 ක ගෙන් යුත් තේ කර්මාන්ත ශාලාවක් හිමිය. ඇගේ තේ කර්මාන්ත ශාලාවෙන් තත්ත්වයෙන් උසස් තේ කුඩු නිපදවයි. නමුත් ඉසුරු සහ ඔහුගේ බිරිඳ පවසා සිටියේ තම ව්‍යාපාර සම්බන්ධයෙන් දුර්වලතා හා තර්ජන රැසක් පවතින බවය.

(i) ව්‍යාපාර වර්ගීකරණ නිර්ණායක හතරක් යටතේ ඉසුරුගේ හා ඔහුගේ බිරිඳගේ ව්‍යාපාරය අයත් වන ව්‍යාපාර වර්ග වෙන වෙනම ලියා දක්වන්න. (ල. 04)

(ii) ඉසුරු සහ ඔහුගේ බිරිඳගේ ව්‍යාපාරයන් සම්බන්ධයෙන් පවතින දුර්වලතා, තර්ජන වෙන වෙනම පැහැදිලි කරන්න. (ල. 04)

(iii) අ) තේ කර්මාන්තශාලා හිමියන් වෙනුවෙන් සකස් කරන ආචාරධර්ම පද්ධතියකට ඇතුළත් කළයුතු ආචාරධර්ම දෙකක් යෝජනා කරන්න. (ල. 02)

ආ) සමාජ හා සංස්කෘතික තිරසර බව තහවුරු කිරීම සඳහා කටයුතු කිරීමේදී ඉහත සිද්ධියට අදාළව ව්‍යාපාරිකයන් අවධානය යොමු කළ යුතු කරුණු දෙකක් පැහැදිලි කරන්න. (ල. 02)

(iv) අ) ඉසුරුගේ බිරිඳට තේ අලෙවිය ඉහළ නංවා ගැනීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග දෙකක් දක්වන්න. (ල. 02)

ආ) ඉසුරුගේ බිරිඳගේ තේ කර්මාන්ත ශාලාවේ ප්‍රධාන නිෂ්පාදිත ඉදිරිපත් කරනු ලබන්නේ දේශීය වෙළඳපළට නොව විදේශීය වෙළඳපළට යැයි සිතන්න. එසේ සිදු කිරීමෙන් ඇතිවන වාසි දෙකක් සඳහන් කරන්න. (ල. 02)

(v) අ) මෙවැනි ව්‍යාපාර පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සැපයීම තුළින් ශ්‍රී ලංකා රජය ඉටුකර ගැනීමට අපේක්ෂා කරන ආර්ථික අරමුණු දෙකක් සඳහන් කරන්න. (ල. 02)

ආ) රජයෙහි අපේක්ෂිත අරමුණු ඉටු කරගැනීම සඳහා ව්‍යාපාර වලට දායක විය හැකි ආකාර දෙකක් දක්වන්න. (ල. 02)

02. ''ශාලිත රැකියාවක් සඳහා ජපානයට ගොස් මෙරටට පැමිණි තරුණයෙක්'' නැවත විදේශ ගත වීමට අදහස් නොකරන ඔහු තමන්ගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරයි''

(i) අ) ඒ සඳහා සුදුසු ව්‍යාපාර සංවිධානයක් තෝරා ගැනීම පිළිබඳව දෙගිඩියාවෙන් පසුවෙයි නම් ඔහුගේ අවධානයට යොමු කරවන සාධක හතරක් නම් කර පැහැදිලි කරන්න. (ල. 02)

ආ) ඇපයෙන් සීමිත සමාගමක ආවේණික ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ල. 02)

(ii) හම්බන්තොට ප්‍රදේශයේ කිරි ගොවීන් ඒකරාශී වී තම නිෂ්පාදිත වලට ඉහළ මිලක් හා හොඳ වෙළඳපළක් ලබාගැනීමට අතරමැදියන්ගේ ගසාකෑම් වළක්වා ගැනීමත් යන පොදු අරමුණු මුදුන් පමුණුවා ගැනීමට සමූපකාර සමිතියක් ඇරඹීමට සාකච්ඡා කළහ.

අ) මෙම සමිතියට අවම හා උපරිම සාමාජිකයින් කී දෙනෙකු සම්බන්ධ කර ගත හැකිද? සමිතිය ලියාපදිංචි කිරීමට අවශ්‍ය ලියවිලි මොනවාද? (ල. 02)

ආ) මෙම සමිතියේ සාමාජිකයින්ට මග පෙන්වන සමුපකාර ප්‍රතිපත්ති ඉදිරිපත් කරන්න. (ල. 02)

(iii) අ) ව්‍යවසායකත්ව නිපුණතා සංවර්ධනයේ දී වඩාත් වැදගත් සාධකයක් වන්නේ 'අවස්ථාවයි' අවස්ථාව යනු කුමක්දැයි හඳුන්වා අවස්ථාවක තිබිය යුතු ගති ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 02)

ආ) 'අවදානම් දැරීම' ව්‍යවසායකයෙකු තුළ දැකිය හැකි මූලික ලක්ෂණයකි. ව්‍යවසායකත්ව කාර්යයෙහි නියුතු ව්‍යවසායකයෙකු විසින් මුහුණ දෙනු ලබන අභියෝග හතරක් සඳහන් කරන්න. (ල. 02)

(iv) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට ඉවහල් වන ඇතැම් හේතු පුද්ගල බද්ධ වේ. එවැනි හේතු හතරක් නම්කර විස්තර කරන්න. (ල. 04)

(v) ව්‍යවසායකයින් ව්‍යාපාරික අවදානම් වලට මුහුණ දෙයි. එහෙත් ක්ෂේත්‍රයේ බොහෝ විට දැකිය හැක්කේ ව්‍යවසායකයින් කුඩා ව්‍යාපාර ආරම්භ කිරීමට පෙළඹීමයි. ව්‍යවසායකත්ව හා කුඩා ව්‍යාපාර අතර සම්බන්ධය පැහැදිලි කරන්න. (ල. 04)

03. ව්‍යාපාරිකයෝ තම ව්‍යාපාර කටයුතු කරගෙන යාමේදී ජංගම ගිණුම් පවත්වාගෙන යාමට කටයුතු කරයි.

(i) අ) ඉතුරුම් ගිණුමක් පවත්වාගෙන යාමට වඩා ජංගම ගිණුමක් පවත්වාගෙන යාම ව්‍යාපාරිකයෙකුට වැදගත් වන්නේ ඇයිදැයි කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 02)

ආ) ගනුදෙනුවලදී මුදල් පිළිබඳ පොදු පිළිගැනීමක් ඇතිවීමට නම් එම මුදල තුළ පැවතිය යුතු පැවතිය යුතු ගුණාංග 04ක් දක්වන්න. (ල. 02)

(ii) අ) 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහබැංකු පනතට අනුව මහබැංකුවේ ප්‍රධාන අරමුණ කුමක්ද? (ල. 02)

ආ) මහබැංකුවේ කාර්යයන් 04ක් සඳහන් කරන්න (ල. 02)

(iii) ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන රටතුළ ණය කාඩ්පත් ප්‍රචලිත කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇති බව පෙනේ.

අ) ලොව ප්‍රකට ණය කාඩ්පත් සන්නම් 4ක් නම් කරන්න. (ල. 02)

ආ) ණයකාඩ්පත් භාවිතයෙන් අනුමත වෙළඳසැල් වලට අත්වන වාසි 02ක් ලියන්න. (ල. 02)

(iv) අමල්ගේ මෝටර් රථය අනතුරකට ලක් වීමෙන් සිදු වූ අලාභය රු. 100 000 ක් ලෙස තක්සේරු කර ඇත. මෙම මෝටර්රථය රු. 2 000 000 වටිනා අතර එය රුපියල් 1 800 000 කට A රක්ෂණ සමාගමේ ද රු. 1 200 000 කට B රක්ෂණ සමාගමේ ද රක්ෂණය කර ඇත.

වාහනයේ සම්පූර්ණ ලාභය රක්‍ෂණ සමාගම් දෙකෙන්ම ලබාගත හැකිද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ල. 04)

(v) අ) ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ කාර්යයන් 04ක් දක්වන්න. (ල. 02)

ආ) රක්‍ෂණය කළ නොහැකි අවධානම් මොනවාද? (ල. 02)

04.(i) අ) වාචික සන්නිවේදනයේ දී අදාළ පණිවුඩය කෙරෙහි අපේක්ෂිත ප්‍රතිචාර නොලැබීම කෙරෙහි බලපා ඇති හේතු දෙකක් පැහැදිලි කරන්න. (ල. 02)

ආ) ශ්‍රී ලංකාවේ සන්නිවේදන ක්ෂේත්‍රයේ ප්‍රවණතා හතරක් ඉදිරිපත් කරන්න. (ල. 02)

(ii) ''රටක කාර්යක්ෂමතාවය හා සුවපහසු ප්‍රවාහන පද්ධතියක් පවතී නම් එරට ආර්ථික සංවර්ධනයට එය හිතකර වන අතර ප්‍රාදේශීය සංවර්ධනය සම්බන්ධයෙන් ඇතිවන විෂමතා ද ඉන් අඩුවිය හැකිය. එමනිසා, ප්‍රවාහනය සමාජීය අවශ්‍යතාවයක් ලෙස ද හඳුන්වා දිය හැකිය.

අ) වෙළෙන්දාට හා පාරිභෝගිකයාට ප්‍රවාහනය ප්‍රයෝජනවත් විය හැකි ආකාර දෙක බැගින් ඉදිරිපත් කරන්න. (ල. 02)

ආ) මහාමාර්ග සම්බන්ධයෙන් බලපාන නෛතික කරුණු හතරක් පෙන්වා දෙන්න. (ල. 02)

(iii) ගබඩාකරණය යනු තොග මිලදී ගත් අවස්ථාවේ හෝ නිෂ්පාදනය කළ අවස්ථාවේ සිට ඒවා අලෙවිකරණ තෙක් හෝ භාවිතයට ගන්නා තෙක් හෝ බෙදාහරින තෙක් රැස්කර තබාගැනීමේ හෝ කල්තබා ගැනීමේ ක්‍රියාවලියකි.''

අ) ගබඩාවක් ස්ථානගත කිරීමේදී සලකා බලනු ලබන කරුණු හතරක් සඳහන් කරන්න. (ල. 02)

ආ) ගබඩාකරණ ක්‍රියාවලිය ලියා දක්වන්න. (ල. 02)

(iv) විද්‍යුත් වෙළඳාමේ ක්‍රියාපටිපාටිය දක්වා විද්‍යුත් වෙළදාමෙන් සමාජීය වශයෙන් ලැබෙන වාසි 04ක් දක්වන්න. (ල. 04)

(v) ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ තුළ සුපිරි වෙළඳසැල් ආරම්භ කිරීම වැඩි වශයෙන් දක්නට ලැබේ. සුපිරි වෙළඳසැල් වලින් පාරිභෝගිකයන්ට ලැබෙන වාසි 04ක් සඳහන් කරන්න. (ල. 04)

## II කොටස

05. කළමණාකරනය පුද්ලයන්ගේ මෙන්ම සංවිධානවල පරමාර්ථ හා අරමුණු සාධනය සඳහා අවශ්‍ය වේ.

(i) අ) සංවිධානවල පරමාර්ථ හා අරමුණු සාධනය සඳහා කළමණාකරණය බලපාන අයුරු පැහැදිලි කරන්න. (ල. 02)

ආ) හෙන්රි මින්ට්ස්බර්ග් (Henry Mintzbery) දක්වන පරිදි කළමණාකරුවන්ගේ තොරතුරු භූමිකාව යටතේ පවතින උපභූමිකා දෙකක් සඳහන් කර එම භූමිකාවලට අයත් කාර්‍යය සඳහා නිදසුන් දක්වන්න. (ල. 02)

(ii) අ) අග්‍ර කළමණාකරුවන් සමස්ථ සංවිධානයේ ම ඉදිරි ගමන් මඟ තීරණය කරන අතර සමස්ථ ආයතනය සඳහාම වගකීම දරයි. ඒ අනුව එම කළමණාකරුවන්ට පැවරෙන කාර්යයන් 04ක් සඳහන් කරන්න. (ල. 02)

ආ) අග්‍ර කළමණාකරුවන් සඳහා වඩා වැදගත් වන කළමණාකරන කුසලතාවය කුමක්ද? හේතු දක්වන්න.(ල. 02)

(iii) අ) තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී හොඳම විකල්පය තෝරා ගැනීම සඳහා භාවිතා කළ හැකි නිර්ණායක මොනවාද? (ල. 02)

ආ) ව්‍යාපාර අරමුණක තිබිය හැකි ගුණාංග 04ක් දක්වන්න. (ල. 02)

(iv) සැලසුම්කරණයේ දී පැන නගින ගැටළු හා සීමා 04 ක් විස්තර කරන්න. (ල. 04)

(v) අ) දෙපාර්තමේන්තුකරණය සඳහා යොදා ගන්නා පදනම් මොනවාද? (ල. 02)

ආ) වසර දෙකකට ආසන්න කාලයක් තිස්සේ පවත්වාගෙන යන 'තරු ටෙක්ස්' ආයතනයේ ඇගලුම් සේවකයන් දිරිගැන්වීම සඳහා ආයතනයේ කළමණාකාරීත්වය අදහස් කරයි. සේවකයන් දිරිගැන්වීම සඳහා ක්‍රියාත්මක කළ හැකි අභිප්‍රේරණ ක්‍රම 04ක් දක්වන්න. (ල. 02)

06. සංවිධානයක අපේක්ෂිත අරමුණු හා ප්‍රමිති සත්‍ය වශයෙන් ලඟාකරගෙන තිබේද යන්න සහතික කරගැනීම සඳහා අනුගමනය කෙරෙන ක්‍රියාවලිය පාලනය ලෙස හඳුන්වයි.

(i) අ) පාලන ක්‍රියාවලිය ආයතනයකට වැදගත් වන්නේ ඇයි? (ල. 02)

ආ) පාලන ක්‍රියාවලියේ පියවරයන් දක්වන්න. (ල. 02)

(ii) ව්‍යාපාරයන් විසින් තම මෙහෙයුම් කළමණාකරන කටයුතු ඉතා සාර්ථක ලෙස කරගෙන යාම රටක ආර්ථික සංවර්ධනය කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ල. 04)

(iii) නිෂ්පාදන සැලැස්මක් පිළියෙල කිරීමේදී සැලකිලිමත් විය යුතු සාධක මොනවාද? (ල. 04)

(iv) A. ඇතැම් නිෂ්පාදකයන් විසින් එක වර්ගයක භාණ්ඩ කිහිපයක් එකවරකට නිෂ්පාදනය කරයි
B. ඇතැම් නිෂ්පාදකයින් විසින් එකම වර්ගයක භාණ්ඩයක් අඛණ්ඩව විශාල ඒකක ප්‍රමාණයකින් නිෂ්පාදනය කරයි.

අ) ඉහත අවස්ථා දෙකේදී නිෂ්පාදකයන් විසින් භාවිතා කරනු ලබන නිෂ්පාදන ක්‍රම 2 නම් කරන්න. (ල. 02)

ආ) ඉහත ඔබ නම් කරන ලද එක් එක් නිෂ්පාදන ක්‍රමයේ හිතකර ලක්ෂණ දෙක බැගින් සඳහන් කරන්න(ල. 02)

(v) නිෂ්පාදන ආයතනයක් විසින් තම නිෂ්පාදන ක්‍රමය තීරණය කර පසුව එයට සුදුසු පිරියත සැලැස්මක් සකස් කර ගත යුතුය. එවැනි පිරියත සැලැස්මක් සකස් කිරීමට පෙර සලකා බැලිය යුතු සාධක මොනවාද? (ල. 04)

07. ''අලෙවිකරණය ව්‍යාපාරිකයින්ට පමණක් නොව පාරිභෝගිකයන්ට ද ප්‍රයෝජනවත් වේ''

(i) අ) අලෙවිකරණය පාරිභෝගිකයින්ට ප්‍රයෝජනවත් වන ආකාරය කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ල. 02)

ආ) අලෙවිකරණය සාර්ථක කරගැනීම සඳහා අලෙවිකරණ මිශ්‍රය වැදගත් වන ආකාරය පෙන්වා දෙන්න. (ල. 02)

(ii) ආනයනික අමුද්‍රව්‍ය ඇසුරින් භාණ්ඩ නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් පවත්වාගෙන යන ව්‍යාපාරිකයෙකු බෙදාහැරීම් මාර්ගයක් තීරණය කිරීමේදී අවධානය යොමු කළ යුතු කරුණු හතරක් පැහැදිලි කරන්න. (ල. 04)

(iii) අ) තම ව්‍යාපාරික ස්ථානය කුලියට ලබාදීමට අපේක්ෂා කරන පුද්ගලයෙකු ඒ පිළිබඳව දැන්වීම පුවත්පතක පල කිරීම වෙනුවට අන්තර්ජාලයේ පල කිරීමට තීරණය කර ඇතැයි සිතන්න. එමගින් ඔහුට අත්වන වාසි දෙකක් සඳහන් කරන්න. (ල. 02)

ආ) වෙළඳපළ ඛණ්ඩනය කිරීමේ පදනම් හතරක් දක්වන්න. (ල. 02)

(iv) අ) අදාළ නිෂ්පාදිතයට ආරක්ෂාවක් ලැබීම හැරුණු විට ඇසුරුමකින් නිෂ්පාදිතයන්ට ලැබෙන වෙනත් ප්‍රතිලාභ දෙකක් විස්තර කරන්න. (ල. 02)

ආ) ව්‍යාපාරයක විකුණුම් වර්ධනයට 'මහජන සම්බන්ධතා' උදව් වන ආකාර දෙකක් දක්වන්න. (ල. 02)

(v) අ) අලෙවිකරණ මිශ්‍රයට අයත් විචල්‍යයක් ලෙස ''බෙදාහැරීම / ස්ථානය'' වැදගත් වන්නේ කෙසේ දැයි කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 02)

ආ) ව්‍යාපාර ආයතන 'ඍජු අලෙවිකරණය' යොදා ගැනීම නිසා පාරිභෝගිකයින්ට අත්වන ප්‍රතිලාභ දෙකක් විස්තර කරන්න. (ල. 02)

08. (i) අ) යම් නිෂ්පාදිතයක් සම්බන්ධයෙන් පාරිභෝගික වටිනාකම් ධූරාවලිය ලියා දක්වන්න. (ල. 02)

ආ) ''තරඟකාරී ව්‍යාපාර පරිසරයට වඩාත් යෝග්‍ය වන්නේ පරිපූර්ණ ඒකබද්ධ ප්‍රවේශයකි'' ඒ අනුව සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පය බිහිවන්නට විය. එම සංකල්පය අවධානය යොමු කරන ප්‍රධාන අංශ හතර කවරේද? (ල. 02)

(ii) අ) භාණ්ඩයක ගුණත්වය නැතහොත් තත්ත්වය යන්න හඳුන්වන්න. (ල. 02)

ආ) තොග ඇණවුම් කිරීමේ පිරිවැය යන්නට ඇතුළත් පිරිවැය වර්ගයන් නම් කරන්න. (ල. 02)

(iii) අ) මූල්‍ය කළමණාකරණයට අයත් දිගු කාලීන ආයෝජන තීරණ නම් කරන්න. (ල. 02)

ආ) මුදල් අයවැය ලේඛනයක දැකිය හැකි අපේක්ෂිත මුදල් ලැබීම් මාර්ග සහ අපේක්ෂිත මුදල් ගෙවීම් මාර්ග මොනවාද? (ල. 02)

(iv) ව්‍යාපාරයක අරමුදල් අවශ්‍යතා සපුරා ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 04)

(v) අ) ආයතනයක් තම අරමුදල් ජංගම සහ ස්ථාවර වත්කම් වල ආයෝජනය කිරීමේදී සලකා බලන කරුණු මොනවාද? (ල. 02)

ආ) ආයතනයක අභ්‍යන්තර, මූල්‍ය සම්පාදන මාර්ග වල වාසි හා සීමා දක්වන්න. (ල. 02)